කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර වාර අවසාන පරීක්ෂණය(ආර්ථික විද්‍යාව)-2016 / 2017

දෙවන සෙමෙස්තරය

**ECN 2228: ලෝක ආර්ථිකය**

කාලය- පැ දෙකයි (02)

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. සියලුම ප්‍රශ්න වලට සමානව ලකුණු ලැබේ.**

---

1. "මානව සංවර්ධන වාර්තාවන්හි සංවර්ධනය පිළිබඳ අවධානය ජාතික ආදායම් ගිණුම්කරණ සංවර්ධනයෙන් මානව කේන්ද්‍රීය ප්‍රතිපත්තීන් දක්වා විතැන් වී ඇත."
   1. ඉහත ප්‍රකාශය කෙටියෙන් පරීක්ෂා කරන්න.
   2. ජාතික අදායම් ගිණුම්කරණයේ දුර්වලතාවන් ඔබ පරීක්ෂා කරන්නේ කෙසේද?
   3. ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල අදායම ඉහළ මට්ටමක නොපැවතියද ඉහළ මානව සංවර්ධන දර්ශක වාර්තා පවත්වා ගැනීමට හැකිවී ඇත්තේ කෙසේද?

2. "ගෝලීය වශයෙන් පවත්නා ගැටුම්වල ප්‍රතිවිපාකයන් සමාන වුවද ඒවායේ ඓතිහාසික පසුබිම සහ මෑතකාලීන ගෝලීය වෙනස්කම් පවතී."
   1. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
   2. වර්තමානයේ මැද පෙරදිග පවතින අර්බුදයන් ඔබ පරීක්ෂා කරන්නේ කෙසේද?
   3. වර්තමානයේ ගෝලීය ගැටුම්වල ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?

3. "භාණ්ඩ හා සේවා සඳහා ගෙවීම් කිරීමේ මාධ්‍යක් ලෙස දෘඩ මුදල් (hard currencies) ලොව පුරා පුළුල් ලෙස පිළිගනු ලබයි."
   1. දෘඩ හා මෘදු මුදල්හි (hard and soft currencies) පවත්නා වෙනස්කම් කෙටියෙන් පරීක්ෂා කරන්න.
   2. දෘඩ මුදල් මගින් රටවල් වලට ලැබෙන්නා වූ ප්‍රධාන වාසි මොනවද?
   3. ශ්‍රී ලංකා රුපියලෙහි වර්තමාන කාර්යසාධනය ඔබ විභාග කරන්නේ කෙසේද?

4. "දෙවන ලෝක යුද්ධයෙන් පසුව වුවද ගෝලීය ආර්ථික අවපාතයන් (recessions) කිහිපයක්ම සිදුව තිබේ."
   1. කොටස් වෙළඳපොල බිඳවැටීම් (stock market crashes) හා ආර්ථික අවපාත (economic recession) අතර පවතින සබඳතාවය කුමක්ද?
   2. ආර්ථික අවපාතයන්ගේ (economic recessions) ප්‍රධාන ආර්ථික ප්‍රතිවිපාක මොනවාද?
   3. ආර්ථික අවපාතවල (economic recessions) ප්‍රතිවිපාකයන්ගෙන් වන බලපෑම අවම කිරීමට ඔබ යෝජනා කරන්නේ මොනවාද?

5. “නැගී එන ඉන්දියාව, ශ්‍රී ලංකා ආර්ථිකයට අභියෝගයක් ලෙස සලකනවාට වඩා අවස්ථා උත්පාදනයක් ලෙස සැලකිය යුතුය”.
   i. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
   ii. 1990 මුල් භාගයේ සිට ඉන්දියානු ආර්ථිකය අධික වේගයකින් වර්ධනය වූයේ ඇයි?
   iii. ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කිරීමට ඉන්දියානු ආර්ථිකයෙන් උගත හැකි පාඩම් මොනවද?

6. “ලෝක බැංකුව ලෝකයේ රටවල් ඒක පුද්ගල ආදායම අනුව වර්ගීකරණය කරයි ”
   i. ලෝක බැංකුවේ රටවල් වර්ගීකරණය කෙටියෙන් හඳුන්වන්න.
   ii. ඔබ මෙම වර්ගීකරණය යටතේ දකුණු ආසියාතික ආර්ථිකයන් පරීක්ෂා කරන්නේ කෙසේද?
   iii. ලෝක බැංකු වර්ගීකරණයේ ප්‍රධාන දුර්වලතාවයන් මොනවාද?

7. “21 වන සියවසේ ලෝක ආර්ථිකය තුළ ආසියාව, වර්ධනයේ එන්ජිම බවට පත්ව ඇත.”
   i. ආසියාවේ ඉහළ ආර්ථික කාර්ය සාධනය සඳහා බලපාන ප්‍රධාන සාධකයන් කවරේද?
   ii. ආසියාවේ ඉහළ ආර්ථික කාර්ය සාධනයේ ප්‍රධාන ගෝලීය ආර්ථික ප්‍රතිවිපාක කවරේද?
   iii. ශ්‍රී ලංකාව වේගයෙන් වෙනස්වන ආසියානු ආර්ථිකයන් සමඟ සමගාමීව ගමන් කරන්නේද? ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

8. පහත මාතෘකා **තුනක් (03)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

   i. ලෝක ඛනිජ තෙල්වෙළඳපොළ
   ii. ලෝක දරිද්‍රතාවය
   iii. විදේශ සෘජු ආයෝජනය
   iv. උතුරු - දකුණු බෙදීම
   v. ඇමරිකා එක්සත් ජනපද ආර්ථිකය